**ක්‍රමලේඛන ව්‍යාපෘති සකස් කිරීමේ පහසුකම් ව්‍යාපෘතිය - 2018**

**----------------------------------------------------------------------**

ක්‍රමලේඛන ව්‍යාපෘති සකස් කිරීමේ පහසුකම් ව්‍යාපෘතියේ 2018 ජනවාරි 26 දින සිට 2018 දෙසැම්බර් 31 දින දක්වා වූ පළමු ගිණුම්කරණ කාලපරිච්ඡේදය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය හා ප්‍රතිසංස්කරණය හා සංවර්ධනය සඳහා වූ ජාත්‍යන්තර බැංකුව අතර 2018 ජනවාරි 26 දින එළඹි මූල්‍ය ගිවිසුම් අත්තිකාරම් අංක:පී-4910 හි 2 වැනි පරිච්ඡේදයේ 2:05 (ඇ) වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුවට වාර්තා කළ යුතු යැයි මා සලකන මාගේ අදහස් හා නිරීක්ෂණ මෙම වාර්තාවේ දැක්වේ.

## 1.2 ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම, අරමුණු, අරමුදල් යෙදවීම හා කාලය

-----------------------------------------------------------------------

ව්‍යාපෘතියේ මූල්‍ය ගිවිසුම් අත්තිකාරමට අනුව, එවකට මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යාංශය යටතේ පැවති වර්තමානයේ ජාතික ප්‍රතිපත්ති, ආර්ථික කටයුතු, නැවත පදිංචි කිරීම් හා පුනරුත්ථාපන, උතුරු පළාත් සංවර්ධන සහ තරුණ කටයුතු අමාත්‍යාංශය යටතේ පවතින ජාතික සැලසුම් දෙපාර්තමේන්තුව, ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරවීමේ නියෝජිතායතනය වන අතර, සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශය, පළාත් පාලන හා පළාත් සභා අමාත්‍යාංශය සහ කෘෂිකර්ම, ග්‍රාමීය ආර්ථික කටයුතු, පශු සම්පත් සංවර්ධන, වාරිමාර්ග සහ ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යාංශය යන අමාත්‍යාංශයන් මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනයන් වේ. ඉදිරියේදී ක්‍රියාත්මක කිරීමට අපේක්ෂා කරන ව්‍යාපෘති වෙනුවෙන් වූ මූලික පහසුකම් සැලසීමේ කටයුතු කිරීම සඳහා ණය දෙන ආයතනය මඟින් මූල්‍යාධාර සැපයීම මෙම ව්‍යාපෘතියේ අරමුණ වේ. මූල්‍ය ගිවිසුම් අත්තිකාරමට අනුව ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත මුළු පිරිවැය එක්සත් ජනපද ඩොලර් මිලියන 4.00 කට සමාන රුපියල් මිලියන 609.55 ක් වූ අතර, ප්‍රතිසංස්කරණය හා සංවර්ධනය සඳහා වූ ජාත්‍යන්තර බැංකුව විසින් එම අරමුදලේ සම්පූර්ණ වටිනාකම මූල්‍යනය කිරීමට එකඟ වී තිබුණි. මෙම ව්‍යාපෘතිය එහි කටයුතු 2018 ජනවාරි 26 දින ආරම්භ කරන ලද අතර, 2020 ජනවාරි 20 දින වනවිට අවසන් කිරීමට නියමිතව ඇත.

## 1.3 මතය

---------

මාගේ මතය අනුව මේ සමඟ ඉදිරිපත් කර ඇති මූල්‍ය ප්‍රකාශනයන් තුළින්, 2018 දෙසැම්බර් 31 දිනට වූ මූල්‍ය තත්ත්වය පිළිබඳ සත්‍ය හා සාධාරණ මතයක් පිළිඹිබු කෙරෙන අතර, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව පිළියෙළ කර ඇත.

## 1.4 මතය සඳහා පදනම

-----------------------

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විසින් විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිත යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් වන විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැලසීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත වන බව මාගේ විශ්වාසයයි.

## 1.5 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම

**------------------------------------------------------------------------------------------**

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම

කළමනාකරණයේ වගකීම වේ. ව්‍යාපෘතියේ මූල්‍ය වාර්තාකරන ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

## 1.6 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

---------------------------------------------------------------------------

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබා දීම සහ මාගේ මතය ඇතුලත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතික වීම උසස් මට්ටමේ සහතික වීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිත ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑම විටම ප්‍රමාණාත්මක අවප්‍රකාශයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා හා වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම් නිසා ප්‍රමාණාත්මක අවප්‍රකාශයන් ඇති විය හැකි අතර ,මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බවට අපේක්ෂා කෙරේ .

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැක මුසු බවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදි. තවද

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නාවූ අවදානම් මගහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ උචිත විගණන සාක්ෂි ලබා ගැනීම මාගේ මතයට පදනම් වේ. ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නාවූ බලපෑම ප්‍රබල වන අතර, දූස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මග හැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මග හැරීම වංචාවක් ඇතිවීමට හේතු වේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස ව්‍යාපෘතියේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත් අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල සහ ගිණුම්කරණ ඇස්තමේන්තුවල කළමනාකරණය විසින් කරන ලද සාධාරණත්වය හා සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල යෝග්‍යතාවය අගයන ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල ඉදිරිපත් කිරීම ව්‍යුහය සහ අන්තර්ගතය ඇගයීමට ලක් කල අතර, ඒ සඳහා පාදක වූ ගණුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශන වල ඇතුලත් බව අගයන ලදී.

මාගේ විගණනය තුලදී හඳුනාගත් වැදගත් විගණන සොයා ගැනීම් ,ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරන ලදී.

## 2. මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 2.1. ගිණුම්කරණ අඩුපාඩු

| ගිණුම්කරණ අඩුපාඩු | වටිනාකම රුපියල් මිලියන | බලපෑම | කළමනාකරණයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශය |
|---|---|---|---|---|
| දේශීය සංවර්ධන ආධාර ව්‍යාපෘතිය මගින් ගෙවා තිබුණු උපදේශක සේවා ගාස්තු, පෞද්ගලික දීමනා යටතේ වැරදි ලෙස පෙන්වා තිබුණි. | 1.90 | උපදේශක සේවා සඳහා වූ පිරිවැය අඩුවෙන් දක්වා තිබුණි. | සිදු වී ඇති ගිණුම්කරණ අඩුපාඩුව ඉදිරි වර්ෂයේදී නිවැරදි කරනු ලැබේ. | ගිණුම්කරණ සටහන් ඇතුලත් කිරීමේ පාලන ක්‍රම ශක්තිමත් කළ යුතුය. |

## 3. භෞතික කාර්ය සාධනය

### 3.1. ව්‍යාපෘතියේ ක්‍රියාකාරකම් වල භෞතික ප්‍රගතිය

ව්‍යාපෘතියේ ප්‍රධාන පරමාර්ථය වනුයේ ජාතික සැලැසුම් දෙපාර්තමේන්තුව විසින් ක්‍රියාත්මක කිරීමට අපේක්ෂා කරන ව්‍යාපෘති 09 ක් වෙනුවෙන් වූ මූලික පහසුකම් සැලැසීමේ කටයුතු කිරීම සඳහා ණය දෙන ආයතනය මගින් මූල්‍යාධාර සැපයීම වන අතර ඉන් ව්‍යාපෘති 03 ක ක්‍රියාකාරකම් සමාලෝචිත වර්ෂය තුලදී සම්පූර්ණ කර ක්‍රියාත්මක කර තිබුණි. අරමුදල් සැපයීමට අපේක්ෂිත තවත් ව්‍යාපෘති 04 ක ක්‍රියාකාරකම් ක්‍රියාවට නංවා සමාලෝචිත වර්ෂය තුලදී සවිස්තරාත්මක සැලැසුම් සකස් කර තිබුණි. රජයේ ප්‍රමුඛතා වෙනස් වීම හේතුවෙන් ඉතිරි ව්‍යාපෘති දෙකෙහි මූලික පහසුකම් සැලසීමේ කටයුතු ප්‍රමාද කර තිබුණි.

### 3.2. ඌණ උපයෝජිත සම්පත්

| විගණන ගැටළුව | බලපෑම | කළමනාකරණයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශය |
|---|---|---|---|
| 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ පළමු ගිණුම් කාල පරිච්ඡේදය තුලදී ව්‍යාපෘතිය විසින් රුපියල් මිලියන 25.71 ක මුදලක්, එනම් ව්‍යාපෘතියේ මුළු ප්‍රතිපාදනය වූ රුපියල් මිලියන 609.55 න් සියයට 8.31 ක ප්‍රතිශතයක් පමණක් උපයෝජනය කර තිබුණි. | අපේක්ෂිත අරමුණ කරා ළඟා වී නොතිබුණි. | විශේෂඥ දැනුම සහිතව සිදු කරන ලද මූලික පහසුකම් සැලසීමේ කටයුතු හා ඊට අදාල වන වියදම් ක්‍රම ලේඛන ව්‍යාපෘති සකස් කිරීමේ පහසුකම් ව්‍යාපෘතියෙහි ඇතුලත් කර නොතිබුණි. | අරමුදල් උපයෝජනය කිරීමේ කටයුතු කඩිනමින් කිරීමට පියවර ගත යුතුය. |